

# අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය



අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය


UNESCO
United Nations
Educational, Scientific and
Cultural Organization

ichcap
International Information and Networking Centre
for Intangible Cultural Heritage in the Asia-Pacific Region
under the auspices of UNESCO

UNESCO
United Nations
Educational, Scientific and
Cultural Organization

Sri Lanka
National Commission
for UNESCO





# අස්පර්ශය සංස්කෘතික උරුමය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය


© Umumura Yutaka


© Sa'id Azadi


© Fumiko Ohinata

© UNESCO / Danson Siminyu

Translator: **A.V. Muditha Ankumbura**
Proofreader: **Dr. Jayantha Jayasiri**

## ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව නිර්මාණය කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි හරයන්, ධර්මතා සහ නීති, සමාජ ප්‍රජාව තුළ විවිධත්වයක් උසුලයි. ඕනෑම සමාජයක් සැළකීමේදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සම්බන්ධ සියලුම ප්‍රකාශනයන් සහ දැනුම සම්ප්‍රේෂණය කිරීම, ඒ ඒ සමාජයන්හි ස්ත්‍රීන් සහ පුරුෂයන් සතු සමාජ භූමිකාව සහ ඔවුනොවුන් අතර පවත්නා සහ සම්බන්ධතා මත රඳාපවතී. එසේ ගත් කල අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය යනු ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව, එහි අනන්‍යතාවය සහ සම්ප්‍රේෂණය හැඩගස්වා ගැනීම සඳහා පවත්නා වරප්‍රසාදයක් වශයෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සහ ස්ත්‍රී, පුරුෂ සමාජ අනන්‍යතාව ගොඩනැගීම අතර එකිනෙක නොබිඳියහැකි සම්බන්ධතාවක් පවත්නා බව පෙනේ.

*බොහෝ ජන සමාජයන්හි ආහාර සම්පාදන කාර්යයෙහි ලා කාන්තාව විසින් සුවිශේෂී භූමිකාවක් උසුලනු ලබයි. මව සහ දියණිය අතර පවත්නා සමාජ සම්බන්ධතාව මත දියණියක් කුඩා කළ සිට ම තම මව විසින් ආහාර සම්පාදනය සහ ආහාර පිසීමේ කාර්ය සිදු කරනු ලබන ආකාරය පිළිබඳව මනාව නිරීක්ෂණය කිරීමෙන් සහ අධ්‍යයනය කිරීමෙන් පසුව එකී කාර්යෙහි ස්වයංව නියැළේ. මෙම ක්‍රියාවලිය මවගෙන් දියණියට වශයෙන් පරපුරින් පරපුරට ක්‍රමානුකූලව පවත්වාගෙන යාම තුළින් එය කාන්තාවක සතු සුවිශේෂී අනන්‍යතා ලක්ෂණයක් වශයෙන් සමාජගත වී තිබේ.*



© UNESCO / Danson Siminyu



© 2008 by Ministry of Culture - Photograph: Iris Biskupic Basic



© 2008 by Ministry of Culture - Photograph: Iris Biskupic Basic

*ඕමානයේ 'බෙඩුයින්' ජන කොටස් අතර සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් සහ උත්සව සඳහා ඔටුවන් යොදා ගැනීම තදින් මුල් බැසගෙන තිබෙන්නකි. ඔටුවන් අභිජනනය කිරීම සඳහා අවශ්‍ය ආම්පන්න සහ උපාංග නිෂ්පාදනය කිරීමේ ශිල්පයේදී පුරුෂයන් සහ ස්ත්‍රීන්ට වෙන් වෙන් වූ භූමිකාවන් ඇත. පුරුෂයන් ලී කැටයම් කරුවන් සහ රිදී භාණ්ඩ සකසන්නන් වන අතර ස්ත්‍රීන් විසින් ගෙත්තම් භාණ්ඩ සකස් කරනු ලබයි. ක්‍රොඒෂියාවේ, හර්වට්ස්කෝ සැගොඡ් හි ගම්වැසියන් විසින් සිදුකරනු ලබන පාරම්පරික ලී සෙල්ලම්බඩු නිෂ්පාදන කාර්යයේදී ද මේ සමානම ශ්‍රම විභජනයක් දැකිය හැකි වේ. පවුල් තුළ පාරම්පරිකව උරුම කර දී තිබෙන ශිල්පක්‍රම මෙහිදී ඔවුන් විසින් භාවිත කරනු ලබයි. පුරුෂයන් විසින් මෙළෙක් වූ විලෝ, ලයිම්, බීච් සහ මේපල් ආදී ශාක කඳන් එකතු කරන අතර පසුව ඒවා වියළා කපාගෙන සාම්ප්‍රදායික උපකරණ භාවිතයෙන් කැටයම් කර සෙල්ලම් භාණ්ඩ සකස් කරන අතර කාන්තාවන් විසින් ඒවා මල් මෝස්තර, ජ්‍යාමිතික රටා හෝ මනඃකල්පිත සිතුවම්වලින් පින්තාරු කර අලංකාර කරනු ලබයි.*

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ ඇතැම් සුවිශේෂී අංශයන් වෙත ප්‍රවේශ වීම සහ ඒවායේ නියැළීම ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත තීරණය වේ. මෙයට උදාහරණයක් වශයෙන් පාරම්පරික ශිල්ප කර්මාන්ත ගත් කළ ඒවා බොහෝ විට කිසියම් අනුපූරක හෝ ස්ත්‍රී පුරුෂ සමාජ කණ්ඩායමකට අයත් වන ලෙස සුවිශේෂී ශ්‍රම විභජනයක් දක්වයි.

අනික් අතට සමාජ පිළිවෙත්, උත්සව අවස්ථා ප්‍රාසාංගික කලා යනාදිය තුළින් ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව, අසමානතාව පිළිබඳ ගැටලු සහ උපයුක්ත ජන කණ්ඩායම් සම්බන්ධ සමාජ මතය කරළියට ගෙන ඒමට අවස්ථාව සැලසී තිබේ. උදාහරණ වශයෙන් බොහෝමයක් සැණකෙළි සම්ප්‍රදායන් සහ ප්‍රසංගවලදී ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව හුවමාරු කොට දක්වන අතර ඇතැම් විට භූමිකාවන් ඉක්මවා යාමට කටයුතු කරයි. මේ ආකාරයට ස්ත්‍රී පුරුෂ සමාජ කාර්යභාරය පිළිබඳ අවබෝධය ඉහළ නැංවීමට, නැවත ආවර්ජනය කිරීමට සහ ඇතැම් විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අභියෝග කිරීමට ද සමාජය විසින් ඉඩහසර නිර්මාණය කරගෙන තිබේ.

## ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකා සහ සම්බන්ධතා විකාශනය

මිනිසා ස්වභාවයෙන්ම ළදරු අවධියේ සිටම ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව උකහා ගනිමින් ඒ පිළිබඳව හැදෑරීමක් සිදු කරයි. කෙසේ වෙතත් ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව යනු විචලනය වන්නකි. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව ද නිරන්තරයෙන් වෙනස්කම් වලට භාජනය වෙමින් සහ පවත්නා සමාජ තත්වයන්ට අනුව  හැඩගැසෙමින් පවතී. තමා අයත් සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව සහ ධර්මතා පිළිබඳව ප්‍රජාව විසින් නිරන්තරයෙන් සාකච්ඡාවට ගනු ලබන අතර අතීතයේ පටන් වර්තමානය දක්වා ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වෙන්ව පවත්වාගෙන එන ලද ඇතැම් අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග සෙසු පාර්ශවයන් වෙත ද විවෘත වී ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වටිනාකම්ල සම්ප්‍රදායන් සහ පරිවර්තනයන් නිර්මාණය කිරීමේදී, ව්‍යාප්ත කිරීමේදී සහ සම්ප්‍රේෂණය කිරීමේදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය වැදගත් භූමිකාවක් ඉටු කරයි. කාලාන්තරයක් තිස්සේ හුරුපුරුදු කරගෙන පැමිණියා වූ යමක් වෙනස් කිරීමට පෙළඹවීම කිසියම්



© Umumura Yutaka

වියට්නාමයේ 'චච් වැන්' යැකදුරන්ගේ ගීත චාරිත්‍රයේදී කාන්තාව විසින් සාම්ප්‍රදායිකව පුරුෂයන්ගේ භූමිකාව, ඇඳුම්පැළඳුම් සහ හැසිරීම් ප්‍රතිවිරුද්ධ වශයෙන් ආරෝපණය කර ගැනීම නිසා ස්ත්‍රී පුරුෂ භූමිකාව පරිවර්තනය වී තිබේ. මීට සමානවම 'කබුකි' නම් ජපන් සාම්ප්‍රදායික නාට්‍යවලදී කාන්තා චරිත සඳහා විශේෂයෙන් යොදා ගන්නා පිරිමි නලුවන් 'ඔනගතා' යනුවෙන් හඳුන්වනු ලැබේ. අනෙක් ප්‍රධාන භූමිකා වර්ග දෙක වන්නේ 'අරගොටෝ' (රළු ශෛලිය) සහ 'වගොටෝ' (මෘදු ශෛලිය) යි. එම භූමිකාවන්ගේ ලක්ෂණ ස්ත්‍රී පුරුෂ බහු අර්ථතාව සහ ස්ත්‍රී පුරුෂ භූමිකා ඉක්මවා යෑමේ හැකියාව මෙන්ම ද්වි ස්ත්‍රී/ පුරුෂ ලිංගික ක්‍රමය සම්බන්ධ ගැටලුවක් බවට පත් වී තිබේ. ජපන් නාට්‍යවල සාම්ප්‍රදායික ශෛලීන් අතරින් වර්තමානයේ 'කබුකි' වඩාත් ජනප්‍රිය වේ.



© Umemura Yutaka

ගැටලුවකට විසඳුම් සොයන්නාක් මෙන් ප්‍රායෝගික විය හැකිය. එසේම මූලධර්ම මත පදනම් වීමෙන් ද සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සිදු කළ හැකි වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ධර්මතා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සම්ප්‍රේෂණය කිරීම කෙරෙහි බලපාන අතර අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ස්ත්‍රී පුරුෂ සමාජ ධර්මතා කෙරෙහි ද බලපායි. මේ නිසා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සහ ස්ත්‍රී පුරුෂ සමාජ ධර්මතා අතර අන්‍යොන්‍ය සහ-සම්බන්ධතාවයක් හඳුනාගත හැකි වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ වෙනස්කම් සිදු කිරීමේ දී බලපා තිබෙන අනෙක් කරුණ වන්නේ සාකච්ඡා ක්‍රියාවලියේ ක්‍රියාකාරී සහභාගිත්වය සහ බලපෑම් ඇති කළ හැක්කේ කාට ද යන ගැටලුව යි. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංරක්ෂණය හා සම්ප්‍රේෂණය කිරීම සම්බන්ධව තීරණ ගැනීම රික්තකයක් තුළ සිදු නොවන අතරම එය ස්ත්‍රී පුරුෂ භාවය සහ බලය පිළිබඳව සබඳතාවලින් සැදුම් ලත් පුළුල් පද්ධතියක් සමඟ ආබද්ධ වී පවතී. මෙම සම්මතයන් සහ සම්බන්ධතා විසින් චර්යාවන්, සබඳතා සහ සාකච්ඡා ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. මෙම අංශ කිසියම් සමාජයක් තුළ සහභාගිත්ව ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සහ බලය පිළිබඳ සම්බන්ධතා තුළනය කිරීමට නිරන්තරයෙන් ප්‍රශ්න කිරීමට භාජනය කෙරේ.

*'සියාට්ටිස්ටා' යනු සයිප්‍රසයේ තිබෙන ක්ෂණිකව නිර්මාණය කර ගත් කවි ගායනය තුළින් අනෙකාව පැරදවීමට උත්සාහ දරන ද්වන්ද කාව්‍ය ස්වරූපයකි. මෙය කාලාන්තරයක් තිස්සේ විවාහ උත්සව, සැණකෙළි සහ අනෙකුත් ප්‍රසිද්ධ උත්සවවලදී ජනප්‍රියත්වයට පත්ව තිබෙන අංගයකි. පාරම්පරිකව මෙම ගායන ශෛලිය පුරුෂයන් අතර පමණක් වාචිකව සම්ප්‍රේෂණය වූ නමුත් මෑතක සිට ස්ත්‍රීන් ද මෙම කවි ගායනය කිරීම ආරම්භ කර තිබේ.*



© 2003 Larnaca Municipality - Photograph: Andreas Larkos



© 2003 Larnaca Municipality - Photograph: Andreas Larkos



© 2005 Department of Traditional Arts at the Research Center of ICHHTO
Photograph: Sa'id Azadi



© 2005 Department of Traditional Arts at the Research Center of ICHHTOPhotograph:
Nabiollah Giyahchi

*සමාජයේ සෑම මට්ටමකදීම වැදගත් භූමිකාවක් ඉටුකරනු ලබන ඉරානයේ පැරණිතම නාට්‍යමය ඉදිරිපත් කිරීම වූ නක්වාලී කතා කීමේ කලාව සම්ප්‍රේෂණය තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව වෙනස් වී තිබේ. ඉරානයේ කාන්තාවන් ස්ත්‍රී සභාවක් ඉදිරියේ පමණක් තනිව රඟ දැක්වීම සාමාන්‍ය ක්‍රමවේදය වුවද අද වන විට නක්වාලි ස්ත්‍රීන් මිශ්‍ර සභාවක් ඉදිරියේ රඟ දක්වති. මෑතක් වන තුරුම නක්වාලී පුරුෂයන් ඔවුනට සුවිශේෂී සමාජ තත්ත්වයක් ලබා දුන් ජනකතා, වාර්ගික වීරකතා සහ ඉරාන සංස්කෘතික සම්ප්‍රදාය යනාදියේ වඩාත් වැදගත් භාරකරුවන් වශයෙන් සලකනු ලැබුව ද වර්තමානය වන විට එම තත්ත්වය කාන්තාවන් හට ද හිමිව තිබේ.*

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්පයේ විවිධත්වය

අස්පර්ශ්‍ය සංස්කෘතිය ප්‍රජාවෙන් ප්‍රජාවට වෙනස් වන්නා සේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්පය ද ඒ සමානවම වෙනස් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධව ගෝලීය වශයෙන් පිළිගත් විශ්වීය මතයක් හඳුනාගත නොහැකිය. තවද ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව සහ වටිනාකම් විශ්ලේෂණය කළ යුත්තේ ඒ ඒ සමාජ කණ්ඩායම මත පදනම් වූ දෘෂ්ටිකෝණයකිනි. උදාහරණයක් වශයෙන්, ඇතැම් උතුරු ඇමරිකානු ස්වදේශික ගෝත්‍රික කණ්ඩායම් අතර පරිවර්තිත ලිංගික සහ ද්විලිංගික ඇතුළුව විවිධ ස්ත්‍රී පුරුෂ සමාජ කණ්ඩායම් හතක් දක්වා හඳුනාගත හැකි වේ.

වර්තමානයේ යුරෝපීය සහ ආසියාතු සමාජ කිහිපයක් විසින් ස්ත්‍රී පුරුෂ කාණ්ඩ තුනක් හෝ වැඩි සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත. බොහෝවිට වයස සහ ස්ත්‍රී පුරුෂභාවය සමීප සම්බන්ධතාවක් දක්වයි. නිදසුනක් ලෙස, ළමා හැසිරීම සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂභාවය හා බැඳි සම්මතයන් හා අපේක්ෂාවන් නව යොවුන් වියේ පසුවන්නන් සහ වැඩිහිටියන් සම්බන්ධයෙන් වෙනස් වේ. ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාවන් සහ වටිනාකම් සමාජයත් සමඟ පරිණාමයට ලක්වන බැවින් මෙම වෙනස්කම් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ භාවිතයන් හා ප්‍රකාශනයන් හි අනුවර්තනය වීම සඳහා මග පෙන්වනු ලබයි.

## ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

සමාජයක ස්ත්‍රී පුරුෂ සබඳතා නිතරම වෙනස් වන බැවින්, අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග ප්‍රගුණ කිරීම හරහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් විෂමතාවන් අවම කර ගැනීම උදෙසා අවස්ථාවන් නිර්මාණය කරගනු ලබයි. සමානාත්මතාව සහ නොවෙනස්ව සැළකීම මූලික මානව හිමිකම් මූලධර්ම වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය පිළිබඳ සැළකීමේ දී මානව හිමිකම් කෝණයෙන් අවධානය යොමු කරනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව අතර විවිධත්වයන් කෙරෙහි පමණක් නොව, එහි දී අදාළ පුද්ගලයන්ට ලැබිය යුතු ගරුත්වය හා යහපැවැත්ම නොසලකා හරින්නේ ද යන්න පිළිබඳව ය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරුකිරීම සඳහා වන සම්මුතිය (CEDAW) මගින් සාම්ප්‍රදායික සංස්කෘතික ආකල්ප සහ භාවිතයන් හෝ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් කොට පවරා ඇති භූමිකාවන් පවා අභියෝග ලෙස නොතකයි. නමුත් ඒ වෙනුවට ඒවායේ ප්‍රතිඵල වශයෙන් ලැබිය හැකි කාන්තා බලය දුර්වල කරවන නැතහොත් කාන්තාවන්ගේ රුචිකත්වයට හානිවන අන්දමේ ඒකාකාරී භූමිකාවන් ඔවුන්ට ආරෝපණය කිරීම වැනි විශේෂිත සෘණාත්මක ප්‍රතිවිපාක කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ.

නොවෙනස්ව සලකන්නා වූ දෘෂ්ටිකෝණයකින් බැලූ කල, වෙනස් කොට සැලකීම සහ යටහත්පහත් භාවය ප්‍රවර්ධනය කරන්නා වූ සාම්ප්‍රදායික භාවිතයන් සංරක්ෂණය කිරීම සඳහා සිදු කරන ඉල්ලීම්වල වලංගුතාව ප්‍රශ්න කිරීමට උචිත වන්නකි. මෙවැනි හිමිකම් මැනිය යුත්තේ එබඳු භාවිතයන් මගින් කොන්කරන ලද සහ බෙලහීන කරන ලද අයගේ හිමිකම් අනුවය. ඇතැම් භාවිතයන් පැහැදිලිවම මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් කිසිසේත් පිළිගත නොහැකි වන නමුත් තවත් බොහෝමයක් පුද්ගලයන් සඳහා වන හානියේ ප්‍රමාණය හඳුනාගැනීමට අපහසු අඳුරු ප්‍රදේශයක පැතිර පැවතීම අතිශය සංකීර්ණ කරුණක් වේ.

මේ තුළින් එවැනි නිර්ණයන් කවුරු විසින් කවදා සිදුකළ යුතු ද යන සංකීර්ණ ගැටලුවක් ද පැන නඟී. මේ සඳහා වෙනස් කොට නොසැලකීම හෙවත් සමානාත්මතා මූලධර්මය සහ ප්‍රජාවගේ යහ පැවැත්මේ රුචිකත්වය තුළ නොවැදගත් සේ සලකන ලද හෝ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්කොට සලකන ලද කණ්ඩයම් ද ඇතුළු අදාළ සියලුම ක්‍රියාකාරිකයන් සම්බන්ධ විය යුතුය. අනෙක් අතට මෙම සමාජ කණ්ඩායම් විසින් ම වෙනස්කොට සැලකීමේ සාම්ප්‍රදායික හුරුපුරුදුවලට සහය දක්වන්නා සේම අනුබල දීම ද සිදු කරයි. මේ සඳහා හේතුව බොහෝ විට එකී හුරුපුරුදුවලට සමාජ ක්‍රියාකාරිත්වය සහ ස්ත්‍රී පුරුෂ ගතිකතාවන් තේරුම් ගැනීමේ ප්‍රායෝගික වැදගත්කම හා සම්බන්ධව පැවතීමයි. සමාජ ව්‍යවහාරයන්ගේ ඇතැම් අංග විසින්ම මානව හිමිකම් උල්ලංඝණය කළ ද එය සමාජ ව්‍යුහයේ වැදගත් ක්‍රියාකාරකමක් වශයෙන් පිළිගැනේ.



© 2013 Cultural Heritage Administration

*'මෙන්ඩලියෝ යා වනවේක්' (MYWO)[1] යනු කෙන්යානු කාන්තා සංවිධානයක් වන අතර ඔවුන් ස්ත්‍රී ප්‍රජනන ඉන්ද්‍රිය ඡේදනය (FGM) සම්බන්ධ චාරිත්‍ර සිදු කරනු ලබන සමාජ කණ්ඩායම් සමග කටයුතු කර ඇත. ඒ හරහා ඔවුන් ඇතැම් සමාජ කණ්ඩායම් සතු එකී චාරිත්‍රය හා බැඳී පවතින ධනාත්මක සමාජ සංස්කෘතික අංගයන් පවත්වාගෙන යන අතරම, ඒ වෙනුවට විකල්ප චාරිත්‍ර හඳුන්වා දීම සඳහා දායක වී තිබේ. මෙම කාන්තා සංවිධානය විසින් එබඳු සමාජවල කාන්තාවන්, ගැහැණු ළමුන්, පියවරුන්  සහ ජන නායකයින් හමුවී මෙම සම්ප්‍රදාය වෙනස් කළ යුතුද සහ එසේ නම් එය කෙසේ සිදු කළ යුතුද යන්න පිළිබඳව අදහස් එක්රැස් කරන ලදී. අනතුරුව ඔවුන් වැඩිවිය පැමිණීමේ සාම්ප්‍රදායික චාරිත්‍රයන්හි ලිංගේන්ද්‍රිය ඡේදනය කිරීමේ චාරිත්‍රය හැර දැරිය හුදකලාව තැබීම, තොරතුරු හුවමාරු කර ගැනීම සහ සැමරීම වැනි අනෙකුත් සියලුම අංග ඇතුළත් කොට විකල්ප වත්පිළිවෙත් පිළිබඳව සැලැස්මක් නිර්මාණය කළහ. එය 'න්ටැනිරා නා මුගම්බෝ' හෙවත් වාචික වශයෙන් සුන්නත් කිරීම යනුවෙන් හඳුන්වන ලදී. කෙන්යාවේ මෙරු ප්‍රදේශයේදී විකල්ප චාරිත්‍රය පළමුවරට ආරම්භ කළ අවස්ථාවේදී හුදකලාව තැබීමේ චාරිත්‍රය සඳහා සහභාගී වූයේ පවුල් දොළහක ගැහැණු ළමුන් තිහක් පමණි. සමාජයේ බොහෝ දෙනෙක් විකල්ප සම්ප්‍රදාය පිළිබඳ විශ්වාසයක් නොතැබූ අතර එය ඉතා ඉක්මනින් සමාජයෙන් ඉවත්ව යනු ඇතැයි සිතූහ. කෙසේ වෙතත් විකල්ප චාරිත්‍රය පුළුල් අවධානයක් ලබා ගැනීමට සමත් වූ අතර පසුව MYWO සංවිධානය විසින් මේ කෙරෙහි උනන්දුවක් දැක්වූ පුද්ගලයන් සහ සමාජ කණ්ඩායම් පිළිබඳ පසු විපරමක් ආරම්භ කරන ලදී. වසරක් තුළ අදාළ ප්‍රදේශයේ පවුල් දෙසීයක් පමණ විකල්ප චාරිත්‍රයට සහභාගී වී ඇති බව දක්නට ලැබුණි.*

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානාත්මතාව පිළිබඳව සාකච්ඡා කිරීමේ දී, එක් ස්ත්‍රී පුරුෂ සමාජ කණ්ඩායමක් විසින් පමණක් පවත්වාගෙන යන චාරිත්‍ර නොසළකා හැරිය යුතුය වැනි සරළ දෘෂ්ටිකෝණයකින් බැලීමෙන් වැළකීමට අතිශය ප්‍රවේශම්කාරී විය යුතුය. බොහෝ විට යථාර්ථය වන්නේ ලොව පුරා බොහොමයක් සමිති සමාගම් නොමැති නම් සමාජය සහ සංස්කෘතික භාවිතයන් වැඩි ප්‍රමාණයක් (වයස, ස්ත්‍රී පුරුෂ භාවය හා අනෙකුත් නිර්ණායක මත පදනම්ව) බෙදී ඇති බවයි. එසේම වෙනස්කම් සිදු වන බවට සලකුණක් ලෙස මෙය පමණක් සැලකිය යුතු නොවේ. සමාජ කණ්ඩායම් විසින් ඔවුන් සතු සමාජ සිරිත් විරිත්, වත්පිළිවෙත්, දැනුම සහ වාචික සම්ප්‍රදායන් යනාදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයන් තුළ සැබැවින්ම වෙනස්කොට සැළකීමක් කර තිබේ ද යන්න හඳුනාගනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් විශ්ලේෂණයක් තුළින් පමණි. තවද, වෙනස්කොට සැළකීමක් හඳුනාගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ වශයෙන් වියුක්ත කර දැක්වීම අත්‍යවශ්‍ය නොවේ.

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රඥප්තිය (මෙතැන් සිට ප්‍රඥප්තිය) තුළින් එහි විෂය පථය තුළ, ජාත්‍යන්තර මානව හිමිකම් නිර්ණායකයන් හා ගැළපෙන අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයන් පමණක් තහවුරු කරන බවට ප්‍රඥප්තියේ 2.1 වගන්තිය අනුව පැහැදිලිව සඳහන් කර ඇත.

1. MaendeleoYaWanawake Organization. 2002. Evaluating Efforts to Eliminate the Practice of Female Genital Mutilation. Raising Awareness and Changing Harmful Norms in Kenya, Washington DC: PATH.

## සංරක්ෂණ කාර්යයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ස්ත්‍රී පුරුෂ සබඳතාව සහ අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් අතර පවත්නා සමීප සම්බන්ධතාවය තේරුම් ගැනීමෙන් ඵලදායී ලෙස අස්පර්ශනීය සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා නව මාවතක් විවර කළ හැකි වේ. මෙම සංරක්ෂණ කාර්යයේදී ජනතාව සතු ප්‍රධාන භූමිකාව අවධාරණය කිරීම මේ සම්බන්ධ වැදගත් අවස්ථාවක් වේ. ප්‍රජාව හා ජන කණ්ඩායම් සමජාතීය නොවන බැවින් සුවිශේෂී අස්පර්ශනීය සංස්කෘතීන් නිරූපණය කරන්නන්ගේ සහ ඔවුන් සතු භූමිකාවන්හි විවිධත්වය හඳුනා ගැනීම මෙන්ම ස්ත්‍රී පුරුෂ වටිනාකම් කෙරෙහි නිසි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවුනහොත් ඵලදායී සංරක්ෂණය සඳහා තිබිය හැකි නව ශක්‍යතාවන් හඳුනා නොගැනීමේ සහ ආභාවිතව පැවතීමේ අවදානමක් ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අශ්පර්ශනීය සංස්කෘතික උරුමය, අණපනත්, භාවිතයන්, සම්ප්‍රේෂණය ආදිය තුළින් සංකීර්ණව මෙන්ම ඉහළ මට්ටමක අන්‍යෝන්‍ය සබඳතාවකින් යුක්තව පවතී. එබැවින් සංරක්ෂණ ප්‍රවේශයන් හරහා ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව සහ සමාජ කොටස්, උප කණ්ඩායම් හෝ පුද්ගලයන්ගේ තරාතිරම සහ ඔවුන් සතු පිළිගැනීම ශක්තිමත් කිරීමේ මෙන්ම දුර්වල කිරීමේ හැකියාවද තිබේ.

ප්‍රඥප්තිය විසින් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සංරක්ෂණ ක්‍රියාමාර්ග ගණනාවක් හඳුනා ගෙන ඇත. ජාතික මට්ටමේදී අස්පර්ශනීය සංස්කෘතිය හඳුනාගැනීම සහ ලේඛනගත කිරීම, ආයතනික ප්‍රතිපත්තිය සහ නෛතික රාමුව ස්ථාපිත කිරීම, සංරක්ෂණ සැලසුම් ගොඩනැගීම, පර්යේෂණ සිදු කිරීම, දැනුවත්කම ඉහළ නැංවීම සහ අධ්‍යාපනික වැඩ සටහන් ආදිය අන්තර්ගත කර ඇත. ගෝලීය මට්ටමේදී සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර සහය ලබා ගැනීමට ඉල්ලුම් කිරීම, සම්මුති ලැයිස්තුවට නිර්දේශ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම හෝ විශිෂ්ට සංරක්ෂණ ක්‍රියාමාර්ග ලේඛන සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව එක් එක් රටවල පවතී.

### *අනන්‍යතාව තුළ ස්ත්‍රී පුරුෂභාවය*

ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීමේ එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය ප්‍රතිනිර්මාණය කිරීමේදී සහ සංරක්ෂණය කිරීමේදී වැදගත්වන කාන්තා දායකත්වය අදෘශ්‍යමාන වීමය. මෙම තත්ත්වය ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ දී දායකත්වය විරළ වශයෙන් හඳුනාගෙන ඇති සමාජයේ කොන් කරන ලද සාමාජිකයින් සඳහා ද අදාළ වේ[2]. ඇතැම් විට අණපනත් මගින් තහවුරු කිරීම මෙලෙස කොන් වූ ලිංගික කණ්ඩායම් සතු අස්පර්ශනීය සංස්කෘතික උරුමය ඔවුන්ට සමාජය විසින් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දී තිබෙන එකම ඉඩ ප්‍රස්ථාව වේ. ජාතික මට්ටමේදී අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනාගැනීම තුළ ලිංගික පක්ෂග්‍රාහිත්වයක් පැවතීම හේතුවෙන් සුවිශේෂී ලිංගික කණ්ඩාම් සතු උරුමය නොසලකා හැරීමේ අවදානමක් ඇති වී තිබේ.

*'වෑනයි' කාන්තා ඉතිහාස ව්‍යාපෘතිය, ඕස්ට්‍රේලියාවේ ආදිවාසී කාන්තාවන් විසින් ස්ථාපිත කර නායකත්වය දුන් වාචික ඉතිහාස ව්‍යාපෘතියකි. මේ තුළින් ඔවුන්ට අදාළ උරුමය හඳුනා ගැනීම සහ උරුමය හඳුනාගැනීමේ දී හා කළමනාකරණය කිරීමේ දී බලපානු ලබන ස්ත්‍රී පුරුෂ පක්ෂපාතීත්වයන් ඇමතීම අරමුණු කරගෙන තිබේ. මෙම කාන්තාවනේ මතය වී ඇත්තේ සිය උරුමය කෙරෙහි තමන් දක්වන සැලකිල්ලට ප්‍රමාණවත් අවධානයක් හෝ නෛතික භාවයක් රාජ්‍ය සැලසුම් තුළින් ලැබී නැති බවය. ඔවුන් සිය උරුමයේ අනාගතය පිළිබඳව වන කතිකාවත්වලදී සිය හඬ ඇසෙන්නට සැලැස්වීමට උපාය මාර්ගයක් සංවර්ධනය කළ අතර එමගින් පිළිගැනීමක් ලබා ගැනීමට හැකි විය.*[3]

**2.** Document ITH/13/8COM/INF.5.c.
**3.** Smith, L., Morgan, A. and van der Meer, A. 2003. Community-driven Research in Cultural Heritage Management: The Waanyi Women's HistoryProject. International Journal of Heritage Studies, Vol. 9, No. 1.



© UNESCO – Photograph: Fumiko Ohinata

### ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ ලේඛනගත කිරීම

ඉහත ආකාරයටම අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය වාර්තා කිරීම, ආශ්‍රිත පර්යේෂණ සහ ලේඛන මඟින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේදී කාන්තාවන්ගේ සහ කොන් කරන ලද සමාජ කණ්ඩායම්වල දායකත්වය වැරදි ලෙස නියෝජනය කිරීම යටපත් කිරීම සිදු කරයි. ප්‍රඥප්තියට අනුව අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ලේඛනගත කිරීම සිදු කළ යුත්තේ අදාළ සමාජ කණ්ඩායම්වල පූර්ණ සහභාගිත්වය තුළිනි. එම නිසා ප්‍රජා-පාදක ලේඛන ගත කිරීම සඳහා පුහුණුව සහ සහය ලබා දීමේදී ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් සමාජයේ කුමන අංශයේ සහභාගිත්වය සම්පූර්ණයෙන් නියෝජනය වන්නේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍යව ඇත. මෙම ක්‍රියාවලිය තුළින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ පුළුල් පරාසයක් හඳුනාගත හැකි වන අතර ඇතැම් ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් උකල්පනයන් හරහා අස්පර්ශ්‍ය සංස්කෘතියේ සම්ප්‍රේෂණය සහ ආරක්ෂාව දෘශ්‍යමාන කළ හැකිවේ.

### සංරක්ෂණ සැලසුම් තුළ ස්ත්‍රී පුරුෂභාවය

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සුවිශේෂී අස්පර්ශ්‍ය සංස්කෘතීන්ගේ අනාගත ස්වභාවය කෙරෙහි බලපෑනු ලබන තීරණාත්මක අවස්ථාවක් වේ. මෙහිදී ඇතැම් ව්‍යවහාරයන්ගේ වැදගත්කම සහ අර්ථය ඒවා මුහුණපා ඇති අවදානම, තර්ජනයන් සහ ඒවා අවම කර ගැනීම සඳහා යෙදිය හැකි ක්‍රමෝපායන්, මානව සහ මූල්‍ය සම්පත් යනාදිය පිළිබඳව ගැඹුරින් සළකා බැලීමට ප්‍රජාව යොමු වේ. මෙම ක්‍රියාවලිය සමාජයේ සියලු දෙනාට ඵලදායී වීම සඳහා විවිධ වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ සමාජ කණ්ඩායම්වල හඬ සැලකිල්ලට ගත යුතු වේ. පළමු අදියරේදී ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂභාවය සහ ඒ හා බැඳි භූමිකාවන් මෙන්ම එය උරුමය හා සම්බන්ධ වන්නේ කෙසේද යන්න පිළිබඳව ස්වයං අවබෝධයක් ඇති කළ යුතුය. රාජ්‍ය බලධාරීන්, සිවිල් සමාජ සංවිධාන, අධ්‍යයන ආයතන සහ පර්යේෂණ කණ්ඩායම්වලට සිය දෘෂ්ටිකෝණයන් සහ ක්‍රමානුකූල දැනුම ඔස්සේ

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංරක්ෂණ කාර්යයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඒකාබද්ධ කිරීම සඳහා දායකත්වය ලබාදිය හැකි වනු ඇත. මූලික අවශ්‍යතාවයක් වන්නේ සාර්ථක සංරක්ෂණ සැලැස්මක් සඳහා දායක විය හැකි ජන කොටස් සහ ස්ත්‍රී පුරුෂ භූමිකාව ඇතුලුව විවිධ භූමිකාවන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව එම ක්‍රියාකාරිකයින් සහ එම ක්‍රියාකාරී ප්‍රජාවට අයත් නොවන්නන් විසින් කරනු ලබන අගය කිරීමයි.



© 2012 agency for Cultural Affairs

## ප්‍රතිපත්ති සංවර්ධනයේදී ස්ත්‍රී පුරුෂභාවය

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සඳහා වන ප්‍රතිපත්ති ගොඩනැගීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ගොඩනැගීම සඳහා නම්, එම ප්‍රතිපත්ති සකස් කිරීම අදාළ ස්ත්‍රී පුරුෂ සමාජ කණ්ඩායම් ඇතුලු විවිධ කොටස්වල ක්‍රියාකාරී සහභාගිත්වයෙන් සිදු කළ යුතුය. මෙම කාර්ය සමාජයේ සුළු පිරිසක, බාහිර විශේෂඥයන් හෝ රාජ්‍ය නියෝජිත ආයතනවල පමණක් සහභාගිත්වයෙන් සිදු කෙරෙන්නේ නම් එය අවදානමකි. ප්‍රඥප්තියේ 2.1 වගන්තියේ සඳහන් පරිදි අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස්කිරීමේ කාර්යය මානව හිමිකම් (ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇතුළු, තිරසර සංවර්ධනය සහ අන්‍යෝන්‍ය ගරුත්වය යනාදියේ මූලිකාංග, තවදුරටත් පෝෂණය වන පරිදි සිදුකළ යුතුය. එමෙන්ම දැනුවත්භාවය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග කිසිදු ආකාරයක දේශපාලනික, සමාජ, වාර්ගික, පදනම් කරගෙන වෙනස් කොට සැලකීම සාධාරණීකරණය කිරීමට හවුල් නොවන බවට තහවුරු කළ යුතුය. (මෙහෙයුම් විධිවිධාන 102) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සම්බන්ධ CEDAW සහ එහි විකල්ප කෙටුම්පත[4]වැනි ජාත්‍යන්තර මෙවලම්



© 2012 by Firoz Mahmud - Photograph: Murshid Anwar

මේ සඳහා උපකාරී වන නිර්දේශිත කියවීම් වේ. තවද ප්‍රතිපත්ති කාර්යන් අන්තර්කරණීය සහ ඵලදායී වීමට වර්තමානයේ රට තුළ පවත්නා ස්ත්‍රී පුරුෂභාවය පදනම් වූ ක්‍රියාකාරකම්හි විවිධත්වය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

4. Convention on the Elimination of All Forms of Discrimination Against Women and its Optional Protocol, see: http://www.ohchr.org/EN/HRBodies/åCEDAW/Pages/CEDAWIndex.aspx.

### *ජාත්‍යන්තර ලේඛන ගත කිරීම තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය*

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවල දී පසුගිය දශකය පුරා නිරන්තරයෙන් ම උරුමයන් ලේඛනගත කිරීම සඳහා වන ඉල්ලීම් ඇගයීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විවාදයන් කර තීරණ ගැනීම සඳහා මූලික වී ඇත. ඇතැම් යෝජනා ලිපිගොනු තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව පිළිබඳ විස්තර අඩංගු වුවද ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව ප්‍රමාණවත් පරිදි සඳහන් කර නොතිබීම සම්බන්ධව උපදේශක කමිටු විසින් සැලකිල්ලට භාජනය කර තිබේ. මෙයට අමතරව සුවිශේෂී අස්පර්ශ්‍ය සංස්කෘතිකාංග සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි නිසි අවධානය යොමු කරමින්, ඒ සම්බන්ධ ක්‍රියාකාරිකයින්ගේ විවිධත්වය සහ ඔවුන්ගේ භූමිකාව විස්තර කිරීමට උපදේශක කමිටුව රාජ්‍ය පාර්ශවකරුවන් දිරිමත් කර තිබේ.[5]

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාවට එක් කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ප්‍රඥප්තියේ වගන්ති සවිස්තර නොවුවද, පාලක මණ්ඩල විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ගැටලු කෙරෙහි වැඩි අවධානයක් ලබා දී ඇති අතර, ලේඛන ගත කොට ඇති අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳව වාර්තා කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරන මෙන් රාජ්‍යයන්ගෙන් ඉල්ලීම් කර තිබේ.[6] ඔවුන්ගේ ඉල්ලීම් මත ජාත්‍යන්තර සහයෝගිතා ක්‍රියාවලින්ට අදාළ සියලු කාර්යයන්හි දී මෙන්ම කාලානුරූපී වාර්තාකරණයේ දී වර්තමානය වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ අන්තර්ගත වන අතර, ඒ අනුව ප්‍රඥප්තියේ මෙහෙයුම් මාර්ගොපදේශයන් සංශෝධනය කර තිබේ. තවද ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන යුනෙස්කෝ ගෝලීය ධාරිතා සංවර්ධන වැඩසටහනෙහි අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංරක්ෂණ කාර්යයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අනුකූල ප්‍රවේශයක් සඳහා වන පුහුණුව සහ ප්‍රතිපත්ති සම්බන්ධ උපදෙස් අන්තර්ගත වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය අතර පවත්නා සබඳතාව තේරුම් ගැනීම ඵලදායී සංරක්ෂණය සඳහා දෙයාකාරයකින් වැදගත් වේ. එනම් සංරක්ෂණයට නව මාවතක් විවර කළ හැකි වන අතර සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සම්බන්ධ ඉදිරි පියවර ශක්තිමත් කිරීමට හැකි වේ. එබැවින් සංරක්ෂණ කාර්යයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාවට ගැනීම අවස්ථාවක් පමණක් නොව අත්‍යවශ්‍යයෙන් සිදු කළ යුතු සදාචාරාත්මක කරුණක් ද වේ.

*කාන්තාවන් සඳහා වන ජාතික කොමිසම විසින් 'ටැලි කලාව' ලේඛනගත කිරීම සහ එය සංරක්ෂණය කිරීම සඳහා ඉහළ ඊජිප්තුවේ කාන්තාවන් පුහුණු කිරීමට, එරට රාජ්‍ය නොවන සංවිධානයක් වන ජන සම්ප්‍රදායන් සඳහා වන ඊජිප්තු සංගමය (ESFT)ට බලය පවරා ඇත. පළමු පුහුණු වැඩසටහන සඳහා කාන්තාවන් තුන්සීයකට අධික ප්‍රමාණයක් සහභාගී වූ අතර පසුව දෙවන වැඩසටහනක් ද පවත්වන ලදී. අභ්‍යාසවල දී කාන්තාවන්ගේ දැඩි රුචිකත්වය හේතුවෙන් ඔවුන්ට අතිශය වැදගත් නමුත් බරපතළ ලෙස තර්ජනයට ලක්ව තිබූ මෙම සුවිශේෂී අස්පර්ශ්‍ය සංස්කෘතිය යළි ප්‍රාණවත් කිරීමට හැකියාව ලැබුණි.*



**5.** Document ITH/13/8COM/7.
**6.** Decision 9.COM 13.a in Document ITH/14/9COM/Decisions.



©2013 Ministry of Culture and Information of the Republic of Kazakhstan







අස්පර්ශ්‍ය
සංස්කෘතික
උරුමය

ICH



The designations employed and the presentation of material throughout this publication do not imply the expression of any opinion whatsoever on the part of UNESCO concerning the legal status of any country, territory, city or area or of its authorities, or the delimitation of its frontiers or boundaries.

The authors are responsible for the choice and the presentation of the facts contained in this book and for the opinions expressed therein, which are not necessarily those of UNESCO and do not commit the Organization.

The present translation has been prepared under the responsibility of the International Information and Networking Centre for Intangible Cultural Heritage in the Asia-Pacific Region under the auspices of UNESCO (ICHCAP) and Sri Lanka National Commission for UNESCO.

© Myriam Jégat, 2009

United Nations
Educational, Scientific and
Cultural Organization

ichcap
International Information and Networking Centre
for Intangible Cultural Heritage in the Asia-Pacific Region
under the auspices of UNESCO

United Nations
Educational, Scientific and
Cultural Organization

Sri Lanka
National Commission
for UNESCO